174926
27/09/2004
ද. 5000L

# දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාව සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය පිළිබඳ විවේචනාත්මක ඇගයීමක්

## 1983 - 2001

# A Critical Evaluation of the International Role of the Liberation Tigers of Tamil Eelam and the Response of the Government of Sri Lanka From 1983 to 2001

එච්. ඒ. ඒ. තිශාත්ත

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

2004

174926

# ප්‍රකාශනය

මෙම නිබන්ධනය ස්වාධීන එකක් බව ද, විධිමත් සඳහනකින් තොරව වෙනත්

ස්ථානයක ප්‍රකාශිත කරුණු උපුටා ගැනීමක් නොකළ

බව ද, වෙනත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා

හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ඉදිරිපත්

කර නොමැති බව ද, එමෙන්ම තවත්

කෙනෙකුගේ ආධාර හා සම්බන්ධතාවයකින්

මෙම නිබන්ධනය සකස් නොකළ බව ද

ප්‍රකාශ කරමි.

එච්.ජ්.ජ්. තිශාත්ත
**GS/ M. phil/ 95 / 966**

# ස්තුතිය !


මෙම නිබන්ධනයේදී මාගේ උපදේශකවරුන් වශයෙන් කටයුතු කරමින්, වටිනා කාලය බොහෝ සෙයින් කැප කොට නන් අයුරින් උපදෙස් දෙමින් හා මග පෙන්වමින් කටයුතු කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ඒ. එම්. නවරත්න බණ්ඩාර ඇඳුරුතුමන් සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයන අංශයේ මහාචාර්ය අමල් ජයවර්ධන ඇඳුරුතුමන් හට මාගේ ඉමහත් ගෞරව පූර්වක ස්තුතිය පළමුව පුද කරමි.

මෙම නිබන්ධනයට ප්‍රවේශ වීමේ අවස්ථාවේදී අවශ්‍ය උපදෙස් ලබා දෙමින්, අධ්‍යයන මාතෘකාව අනුමත කර දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපතිවරුන් ලෙස කටයුතු කළ මහාචාර්ය එම්. ඕ. ඒ. ද සොයිසා,මහාචාර්ය ඒ. සිවරාජා සහ මහාචාර්ය රංජිත් අමරසිංහ ඇඳුරුතුමන්ලා කෘතවේදීව සිහිපත් කරමි.

මෙම නිබන්ධනය පිළියෙළ කිරීමේදී අවශ්‍ය පොත්පත්, ලිපි ලේඛන හා පුස්තකාල පරිහරණ පහසුකම් ලබා දෙමින් සහයෝගය ලබා දුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලීය පුස්තකාලය, ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලීය පුස්තකාලය, කොළඹ ජාතික පුස්තකාලය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ පුස්තකාලය ආදී පුස්තකලයන්හි පුස්තකාලාධිපති තුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලයන්ට මාගේ ස්තුතිය පුද කරමි.

මෙම නිබන්ධනයේ භාෂාව සකස් කොට දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය, ප්‍රවීන නාට්‍යවේදී දිවංගත බන්දුල ජයවර්ධන, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භාෂා සහ සංස්කෘතික අධ්‍යයනාංශයේ හිටපු මහාචාර්ය වෝල්ටර් මාරසිංහ සහ කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයේ ආචාරිනී ඉන්ද්‍රානි රන්මුතුගල යන මහත්ම මහත්මීන්ද කෘතවේදිව සිහිපත් කරමි.

අවසාන වශයෙන් ආදරණීය දෙමව්පියන්ටත්, මෙම නිබන්ධනයේ පරිගණක අකුරු සංයෝජනය කර දුන් අප්සරා, අනුරාධා, රවින්ද්‍රා, සකුන්තලා ශිෂ්‍යාවන්ටත් සහ ඉතා කැපවීමෙන් සහාය දුන් අදරැති බිරිඳ රසංගා සිහිපත් කරමි.

එච්. ඒ. ඒ. නිශාන්ත

අංක : 46 E

බුළුගහගොඩ

ගනේමුල්ල.

# සාරාංශය


ශ්‍රී ලංකාව බහුවාර්ගික සමාජයකින් යුත් රටකි. සිංහල එහි ප්‍රධාන ජනවර්ගය වන අතර ශ්‍රී ලාංකික දෙමළ රටේ ප්‍රධානතම සුළු ජනවාර්ගික කණ්ඩායම වේ. නිදහසට පෙර අවධියේ සිට මෙම ජනවර්ග දෙකේ නායකයන් අතර දේශපාලන සහ පරිපාලන බලයට සහභාගී වීම මුල් කර ගෙන මතභේද ආරම්භ වූ අතර නිදහසින් පසු යුගයේ එය ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම යනුවෙන් හඳුන්වන ගැටුම දක්වා වර්ධනය විය. 1980 දශකයේ සිට ශ්‍රී ලංකා රාජ්‍යය තුළ පවත්නා ප්‍රධාන ගැටළුව බවට පත් වී තිබෙන්නේ මෙම ජනවාර්ගික කණ්ඩායම් දෙක අතර පවත්නා දිග්ගැසුණු ජනවාර්ගික අර්බුදය සහ එමගින් පැන නැගී තිබෙන එල්.ටී.ටී.ඊ. සංවිධානය හා ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක හමුදා අතර සිදු වෙමින් පවතින සිවිල් යුද්ධයයි.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමේ ප්‍රධාන කොටස් කරුවකු වූ එල්.ටී.ටී.ඊ. සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස හෝ ගරිල්ලා සංවිධානයක් ලෙස සැලකිය හැකිය. එහෙත් එය පිළිබඳව ලබා දිය හැකි හොඳම නිර්වචනය වන්නේ ගරිල්ලා යුද්ධයත් ත්‍රස්තවාදයත් අතර අනුදෝලනය වන සංවිධානයක් ලෙස සැලකිය හැකි බවය. එපමණක් නොව දෙමළ ජාතිකවාදයේ වර්තමාන නියෝජිතයා ලෙස ද එල්.ටී.ටී.ඊ. සංවිධානය කටයුතු කරන බැවින් එය ජාතික විමුක්ති ව්‍යාපාරයක් වන බවට මතයක් පවතී. එහෙත් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීමේ දී ජාතික විමුක්ති ව්‍යාපාරයක් ලෙස සැලකීම ගැටළු සහගත වන බව කිව හැකිය.

ආරම්භයේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරීත්වය උතුරු නැගෙනහිර පළාත් වලට සීමා වූ අතර 1983 දෙමළ විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පසුව ඔවුන් තමන්ගේ ක්‍රියාකාරීත්වය ඉන්දියාව ප්‍රමුඛ විදේශ රටවල් කරා ද ව්‍යාප්ත කරන ලදී. ඒ ඔස්සේ එල්.ටී.ටී.ඊ. සංවිධානයට ජාත්‍යන්තර ජාලයක් ගොඩ නැගීමට පදනම සැකසුණු අතර ආරම්භයේ දී එයට ඉන්දියානු රජයේ සහාය හිමි විය. ඊට අතිරේක වශයෙන් ඉන්දියාවෙන් පිටස්තර රටවලට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකික දෙමළ ජනතාව පදනම් කර ගෙන එම රටවලින් නිල නොවන සහායක් හිමි විය.

ඉන්දියාවෙන් පිටස්තර අන්‍ය රටවලට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකික දෙමළ සංක්‍රමණිකයන් පදනම් කර ගෙන සිය රටින් බාහිර වශයෙන් ජීවත් වන ශ්‍රී ලාංකික දෙමළ ජනවාර්ගික ප්‍රජාව බිහි විය. කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ප්‍රංශය, නොර්වේ, ස්විට්සර්ලන්තය හා ඕස්ට්‍රේලියාව ආදී රටවල වාසය කරන මෙම දෙමළ ප්‍රජාව පදනම් කර ගෙන එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වය ගොඩනැගී ඇත. එය ප්‍රචාරක කටයුතු, අරමුදල් සම්පාදනය සහ ආයුධ සපයා ගැනීම වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වේ.

ශ්‍රී ලංකා රජය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට මුහුණ දීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග මිලිටරි හා මිලිටරි නොවන ලෙස ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. මිලිටරි නොවන ක්‍රියාමාර්ග අතර ඉන්දියාව සමග සබඳතා යලි තහවුරු කිරීමට ක්‍රියාකිරීම, අභ්‍යන්තර වශයෙන් දේශපාලන විසඳුමක් සඳහා ක්‍රියාමාර්ග සැකසීම, මානව අයිතීන් උල්ලංඝණය වීම් අවම කිරීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ වෙනත් විදේශ රාජ්‍යයන්ගේ හොඳ හිත දිනා ගැනීමට ක්‍රියාකිරීම වැදගත් විය. මෙලෙස ශ්‍රී ලංකා රජය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට මුහුණ දීම සඳහා කටයුතු කරන අතර ඔවුන් සමග යුධ වැදීමට ද සිදු විය. ඒ අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානය මිලිටරිමය වශයෙන් පරාජය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් යොදා ගත් අතර ආරක්ෂක හමුදාවන්හි මිනිස් බලය වැඩි කිරීම, විශේෂ හමුදා ඒකක ගොඩනැගීම, ඔත්තු සේවාවන් සංවර්ධනය කිරීම, දියුණු සහ වඩාත් නවීන යුධ අවි සැපයීම, ප්‍රහාරාත්මක සහ උපක්‍රමික හමුදා මෙහෙයුම් පවත්වා ගෙනයාම සහ ප්‍රතිවාදී දෙමළ කණ්ඩායම් වල සහාය ලබා ගැනීම වැදගත් ඒවා විය.

සමස්ථයක් ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාවට ප්‍රතිචාර ලෙසින් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ක්‍රියාමාර්ගයන් මිශ්‍ර ප්‍රතිඵල ලැබූ බව කිව හැකිය. එනම් ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය මුළුමනින්ම සාර්ථක හෝ අසාර්ථක නොවූ බවයි. ශ්‍රී ලංකා ආණ්ඩුවට මුළුමනින්ම සාර්ථක ප්‍රතිචාරයක් දැක්විය නොහැකි වූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පවත්වා ගෙන යන අරගලයට උතුරු හා නැගෙනහිර ජීවත් වන දෙමළ

ජනයාගේ සහ සිය රටින් බාහිර වශයෙන් ජීවත් වන දෙමළ ප්‍රජාවේ සහාය හිමි වීමත් මිලිටරිමය සහ මිලිටරිමය නොවන විධි ක්‍රම ඔස්සේ සාර්ථක ප්‍රතිචාරයක් දැක්වීමට අසමත් වූ නිසාය.

එහෙත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර ක්‍රියාකාරීත්වයට එරෙහිව ශ්‍රී ලංකා ආණ්ඩුව 1994 න් පසු කාල පරිච්ඡේදය තුළ ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ගයන් තුළින් යම් ප්‍රමාණයක සාර්ථකත්වයක් ලැබූ බව කිව හැකිය. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටළුව පිළිබඳව විදේශ රටවල් ගණනාවක් කලින් දැරූ අදහස් හා ආකල්පයන් වෙනස් කිරීමටත් එහි ප්‍රතිඵල ලෙසින් ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය ආදී රටවල් එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් කිරීමත් ඒ අතර වැදගත් විය.

මෙම අධ්‍යයනයෙන් 1983-2001 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානයේ ජාත්‍යන්තර භූමිකාව සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිචාරය අධ්‍යයනය කෙරිණි. එහෙත් මෙම අධ්‍යයනය අවසන් කරන අවස්ථාව වන විට එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ශ්‍රී ලංකා ආණ්ඩුව අතර මාස 22 ක සටන් විරාමයක් ද වට කිහිපයකින් සමන්විත වූ සාකච්ඡා ක්‍රියාදාමයක් ද ඇරඹී තිබූ බැවින් 2002 සහ 2003 වර්ෂවල සිදු වූ වර්ධනයන් ද එයට ඇතළත් කරන ලදී. අධ්‍යයන ක්‍රමවේදය ඓතිහාසික විධික්‍රමය මත පදනම් විය. අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර උපයෝගී කරගන්නා ලද අතර දත්ත රැස් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය වූයේ ද්විතීයික මූලාශයන් ය. අධ්‍යයන විෂයට අදාල ප්‍රකාශිත ග්‍රන්ථ, සඟරා, පුවත්පත් සහ පත්‍රිකා එහිදී යොදාගත් අතර එවා සපයා ගැනීමේදී ප්‍රධාන වශයෙන් අන්තර්ජාලය උපයෝගී කර ගන්නා ලදී.

## ABSTRACT

Sri Lanka is a country with a multi-ethnic society. While the Sinhalese constitute the major ethnic group in the country, the Sri Lankan Tamils form the principle community among the minority groups. Even before Sri Lanka gained independence differences of opinion began to surface among the leaders of these two communities regarding the sharing of power in the political and administrative sectors and in the post-independence Sri Lanka. These differences developed into what has now come to be known as 'the ethnic conflict.' The long- drawn ethnic crisis between these two ethnic groups and the resultant civil war between the LTTE and the Sri Lankan security forces has become the main problems the Sri Lankan government has been facing since the 1980s.

The LTTE which is a major contributor to the ethnic conflict in Sri Lanka can be considered as a terrorist movement or a guerrilla organization. It can however, be best described as a movement that oscillate between guerrilla warfare and terrorism. Further there is also a view that the LTTE is a national liberation movement since it is functioning as the main representative of Tamil nationalism. But at a close examination of their activities it may be problematic to characterize it national liberation movement.

At the beginning, the activities of the LTTE were confined to the Northern and Eastern provinces but after the anti Tamil violence unleashed in 1983 they

extended their activities to India and other foreign countries. This laid the foundation for the setting up of an international network for the LTTE, which initially received the support of the Indian Government. In addition it received the unofficial support from other countries besides India, based on the Sri Lankan Tamil diaspora.

In this way, there came in to being an ethnic community of Sri Lankan Tamils, based on the Sri Lankan Tamil Diaspora living in countries outside India. The international machinery of the LTTE have been based on this Tamil community living in countries such as Canada, United States, Britain, France, Germany, Norway, Switzerland, Australia. This consists mainly of three kinds of activity, namely propaganda, fund-raising and procurement of arms.

The course of action adopted by the Sri Lankan government to face the LTTE challenge can be described a two fold military and non military. The non-military course of action included the steps taken to re-consolidate the relation with India, working towards a political solution internally, launching variety of programmes to minimize the violations of human rights and the efforts to win the good-will of other foreign countries. While taking steps in this manner to counter-act the LTTE opposition non- militarily, the Sri Lankan government was also forced to conduct military operations against them. Accordingly a number of strategies were adopted to counter the LTTE militarily, by increasing the numerical strength of the security forces, setting of special force units , improving in the intelligence services, procuring

of high quality and ultra-modern weapons, launching of offensive and strategic military operations and enlisting the support of Tamil groups opposed to the LTTE.

The response of the Sri Lankan government for the LTTE propaganda in the international arena produced mixed results. The counter strategy launched by the Sri Lankan government was not wholly successful or unsuccessful. The failure of the Sri Lankan government to launch an effective propaganda campaign was a result of the support the LTTE received from the Tamil population in the Northern and Eastern Provinces as well as the Tamil Diaspora for its struggle.

It must however be mentioned that the various measures adopted by the Sri Lankan government since 1994 against the LTTE activities in the international arena did meet with a certain amount of success. This went a long way in making a number of foreign countries change their earlier opinions and attitudes towards the ethnic conflict in Sri Lanka and banning the LTTE by a number of countries such as the USA and Great Britain .

This study concentrates on the international role of the Liberation Tigers of Tamil Eealm, during the period 1983-2001 and the response of the Sri Lankan government towards it. However beyond this period, a 22 month old cease-fire agreement between the LTTE and Sri Lankan government and a peace process of several rounds of talk had come into effect. Therefore, a record of the developments that took place during the years 2002 and 2003 too was included in this narrative. The

[library stamp]

research methodology of this study was based on the historical method. Primary and secondary resources constitute the sources of main data. Published works, journals, newspapers and pamphlets relevant to the study were extensively consulted. The internet also extensively used in soliciting information.

## පාරිභාෂිත වදන් පෙළ

| | |
|---|---|
| අරමුදල් සම්පාදනය | Fundraising |
| අභ්‍යන්තර ත්‍රස්තවාදය | Domestic Terrorism |
| ඇෆ්ගන් නළ මාර්ගය | Afghan Pipeline |
| උප ජාතික කණ්ඩායම් | Sub – National Groups |
| ගරිල්ලා යුද්ධය | Guerrilla Warfare |
| ග්‍රාමීය ගරිල්ලා යුද්ධය | Rural Guerrilla Warfare |
| ඡායා රාජ්‍යය | Shadow State |
| ජාත්‍යන්තර සහායක ජාලය | International Support Network |
| ත්‍රස්තවාදය | Terrorism |
| ත්‍රස්තවාදී කණ්ඩායම් | Terrorist Groups |
| ත්‍රස්තවාදයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතීන් | UN Conventions Against Terrorism |
| ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය | War on Terrorism |
| තුන්වන පාර්ශවය | Third Party |
| දිග්ගැසුණු යුද්ධය | Protracted War |
| ද්විතීයික සැපයුම්කරුවන් | Secondary Suppliers |
| දේශාන්තර ත්‍රස්තවාදය | Transnational Terrorism |
| නාගරික ගරිල්ලා යුද්ධය | Urban Guerrilla Warfare |
| නීති විරෝධී ආයුධ වෙළෙඳාම | Illicit Arms Trade |
| නීති විරෝධී ආයුධ වෙළෙඳපොළ | Illicit Market for Guns |

| | |
|---|---|
| ප්‍රති ත්‍රස්තවාදය | Counter Terrorism |
| ප්‍රචාරක කටයුතු | Propaganda |
| පුණ්‍යායතන | Charities |
| බාහිර සම්බන්ධතා | External Links |
| බුද්ධිමය තොරතුරු සේවාව | Intelligence Service |
| මිනිස් ජාවාරම | Human Smuggling |
| මානව සුභසාධන සංවිධාන | Humanitarian Organization |
| මත්ද්‍රව්‍ය වෙළෙඳාම | Drug Trafficking |
| රක්ෂිත වාසස්ථාන | Safe Haven |
| රහසිගත එජන්තයින් | Clandestine Agents |
| රාජ්‍ය ත්‍රස්තවාදය | State Terrorism |
| රාජ්‍ය නොවන කාරකයින් | Non – State Actors |
| රැකවරණ සොයන්නන් | Asylum Seekers |
| විමුක්තිදායකයින් | Liberators |
| විමුක්තිකාමී සංවිධාන | Liberation Organization |
| සටන් විරාම ගිවිසුම | Cease Fire Agreement |
| සත්කාරක රාජ්‍යයන් | Host Governments |
| සිය රටින් බැහැරව ජීවත් වන<br>ජනවාර්ගික ප්‍රජාව | Diaspora |
| සාම ගිවිසුම | Peace Accord |
| ළමා සොල්දාදුවන් | Child Soldiers |

# සංවිධාන නාම

| | |
|---|---|
| අයර්ලන්ත සමූහාණ්ඩු හමුදාව (ප්‍රාදේශීය) | Provincial Irish Republican Army (PIRA) |
| එක්සත් ජාතික පෙරමුණ | United National Front (UNF) |
| කුර්දිස්තාන් කම්කරු පක්ෂය | Kurdistan Worker `s Party (PKK) |
| කැනේඩියානු ආරක්ෂක සහ බුද්ධිමය තොරතුරු සේවාව | Canadian Security & Intelligence Service (CSIS) |
| ජාත්‍යන්තර ක්ෂමා ආයතනය | Amnesty International (AI) |
| දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය | Liberation Tigers of Tamil Eelam (LTTE) |
| පර්යේෂණ හා විශ්ලේෂණ අංශය | Research and Analysis Wing (RAW) |
| පොදු ජන එක්සත් පෙරමුණ | People's Alliance (PA) |
| මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාලීය ආචාර්යවරුන් (යාපනය) | University Teachers for Human Rights (Jaffna) (UTHR-J.) |
| රාජ්‍ය දෙපාර්තමේන්තුව | State Department (SD) |
| ශ්‍රී ලංකා ආණ්ඩුව | Government of Sri Lanka (GOSL) |
| ශ්‍රී ලංකා නිරීක්ෂණ සභාව | Sri Lanka Monitoring Mission (SLMM) |
| සන්ධීය තොරතුරු කාර්යංශය | Federal Bureau of Investigation (FBI) |

# පටුන


| | |
|---|---|
| පළමුවන පරිච්ඡේදය | 1-30 |
| <u>සංකල්පීය රාමුව</u> | |
| 1.1 ප්‍රවේශය | 1-2 |
| 1.2 එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ස්වභාවය වටහා ගැනීම | 2 |
| 1.2.1 ත්‍රස්තවාදය යනු කුමක්ද | 3-7 |
| 1.2.2 ත්‍රස්තවාදය හා ජාතික විමුක්තිය අතර වෙනස | 7-9 |
| 1.2.3 ත්‍රස්තවාදය හා ගරිල්ලා යුද්ධය අතර වෙනස | 9-14 |
| 1.3 ත්‍රස්තවාදී සංවිධානයක ජාත්‍යන්තර භූමිකාව | 14-16 |
| 1.3.1 ප්‍රචාරක කටයුතු | 17-18 |
| 1.3.2 අරමුදල් සම්පාදනය | 18-20 |
| 1.3.3 ආයුධ සපයා ගැනීම | 20-22 |
| 1.4 ත්‍රස්තවාදී සංවිධානයන්හි ජාත්‍යන්තර භූමිකාවට එරෙහිව රාජ්‍යයන්හි ප්‍රතිචාරය | 22-23 |
| 1.4.1 මිලිටරිමය ප්‍රතිචාරයන් | 23-26 |
| 1.4.2 මිලිටරිමය නොවන ප්‍රතිචාරයන් | 26-28 |
| 1.5 අධ්‍යයන ගැටළුව | 29 |
| 1.6 අධ්‍යයනයේ ක්‍රමවේදය | 29 |
| 1.7 අධ්‍යයනයේ සැලැස්ම | 29-30 |
| 1.8 අධ්‍යනයේ සීමා | 30 |